**තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව - 2019**

**----------------------------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

තෘතියීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාවේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම සඳහා ලැබී තිබුණු රු. 456,000 ක මුදල ආදායම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට එම ව්‍යාපෘති වියදමෙන් හිලව් කර තිබුණි. | ආදායම හා වියදම් එකිනෙකට හිලව් නොකොට වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කිරීමට පියවර ගනිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය වෙනස්වීම මත ප්‍රත්‍යාගණනයන් සිදුකල යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශුද්ධ අගය රු. 27,087,974 ක වත්කම් සම්බන්ධයෙන් 2008 වර්ෂයෙන් පසුව ප්‍රත්‍යාගණනයක් සිදුකර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 47 වන ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණවල අගය වෙනස් වීම මත මෙම වසරේදී ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට පියවර ගනිමි. | යොමුගත ප්‍රමිතිය පරිදි ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.70,494,799 ක් වූ වත්කම් සඳහා හඳුනා ගෙන ඇති ඵලදායී ජීවිතකාලය අවසන් වී ඇතත් තවදුරටත් එම වත්කම් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙහිදී ආයතනයේ ක්ෂය කිරීම් සඳහා යොදා ගනු ලබන්නේ හීනවන ශේෂ ක්‍රමය බැවින් යම් කිසි වත්කමක් දිගුකාලයක් පුරා ක්ෂය වේ. ඒ අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර නිමවූ වත්කම් නොමැති බව සඳහන් කරමි. | ක්ෂය ප්‍රතිපත්තිය අනුව අදාල වත්කම්වල ඵලදායී ජීවිත කාලය අවසන් වී ඇති බැවින් නැවත ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කල යුතුය. |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 34 ඡේදය ප්‍රකාරව වාහන අනතුරක් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් විසින් රු.1,200,000 ක වන්දියක් ඉල්ලා නඩු පවරා තිබුණද ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි. | මෙය අසම්භාව්‍ය වගකීමක් ලෙස හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | නිශ්චිත ඇස්තමේන්තුවක් ලබාගත නොහැකි අසම්භාව්‍ය බැරකමක් පවතින බව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 13 ඡේදය පරිදි දේපල පිරියත උපකරණ යටතේ ප්‍රාග්ධනිත කලයුතු එකතුව රු. 197,097 ක් මෝටර් රථ හා ගොඩනැගිලි නඩත්තු වියදම් ලෙස වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි. | කාර්යාල පරිශ්‍රයෙහි ගොඩනැගිල්ල අයිති වන්නේ අමාත්‍යාංශයට වන බැවින් ගොඩනැගිලි සඳහා කරනු ලබන වැඩි දියුණු කිරීම් ගොඩනැගිලි පුරුත්ථාපන වියදම් යටතේ ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලබයි. විගණනණයෙන් පෙන්වා ඇති පරිදි වාහන සඳහා උපාංග සවිකිරීම් මඟින් එහි ආයුකාලය වැඩිවීම සඳහා අදාළ වේ නම් වාහන ගිණුම යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගනිමි. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම කෙටියෙන් | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 2,783,258 ක් වූ ගෙවියයුතු විවිධ වියදම්, මුද්‍රණ වියදම් හා ආංශික වියදම් හා රු. 840,727 ක් වූ ලැබියයුතු සහතික පත්‍ර ආදායම ගිණුම්වලින් අත්හැරී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි පරීක්ෂා කර බලා පෙර වර්ෂ ගැලපුම් ගිණුම යටතේ 2020 වසරට අදාළව ගිණුම්ගත කිරීමට පියවර ගනිමි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වර්ෂයට අදාල සියළු ආදායම් වියදම් ගිණුම්ගත කල යුතුය. |
| (ආ) 2018 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ගෙවා තිබුණු එකතු රු. 2,501,102 ක් වූ ඇගයීම් ගාස්තු, වැටුප් හා අතිකාල දීමනා එම වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පෙර වර්ෂ ගැලපුම් ගිණුමට මාරු කිරීමට පියවර ගනිමි. | මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වර්ෂයට අදාල සියළු වියදම් ගිණුම් ගත කල යුතුය. |
| (ඇ) 2019 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම අනුව රු. 1,463,907 ක්වූ වර්ෂය තුල සෘජු බැරකිරීම් හා රු. 1,002,905 ක් වූ ස්ථාවර නියෝග මත ගෙවීම් ඇතුළු සෘජු හර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා වියදම එම ප්‍රමාණයන්ගෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2019 වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන පිළියෙල කර අවසන් වී තිබූ නිසා එම ගිණුම්ගත නොකල සෘජු හර කිරීම් හා බැර කිරීම් සඳහා 2020 වර්ෂයේදී ගැලපීම් සිදුකර ඇත. | බැංකුව විසින් සිදු කරනු ලබන සෘජු හර හා බැර හඳුනාගෙන වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඈ) බැංකු සැසඳුම් ප්‍රකාශනවල ඇතුලත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකල කල් ඉකුත් වූ රු. 323,028 ක් වටිනා චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව ණයහිමියන් ඇති කිරීමේදී ණයහිමි ගිණුම බැර කිරීම වෙනුවට දෝෂ සහගත ලෙස ණයහිමි ගිණුමට හර කිරීම නිසා එම ගිණුම රු.646,056 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් පරිගණක මෘදුකාංගයේ ගැටළුවක් නිසා 2019.01.01 ලෙස සටහන් වී ඇති නමුත් එය සත්‍ය වශයෙන් එම වරද නිවැරදි කර ඇත්තේ 2019.09.03 ට පසුවයි. | ඉදිරියේදී අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කර ප්‍රමාදයකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කල යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීමඩ කෙටියෙන් | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| අත්තිකාරම් ශේෂය | 1,879,170 | විස්තරාත්මක උපලේඛන | අත්තිකාරම් ගිණුමෙහි ඇති රු. 1,879,170.00ක් වූ අත්තිකාරම් වටිනාකමට අදාළ උපලේඛන විගණනයට ඉදිරිපත් කිරීමට පියවර ගනිමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් තහවුරු කිරීම සඳහා අවශ්‍ය උපලේඛන හා අනෙකුත් සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 103 (1), 104 (3) හා 104 (4) වගන්ති | කොමිෂන් සභාවට අයත් වාහනයක 2016 අගෝස්තු 25 දින සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලයේ විමර්ශණ වාර්තාව අනුව අනුව වැය වූ සම්පූර්ණ මුදල අදාළ රියදුරුගෙන් අයකර ගැනීම නිර්දේශීතව තිබූ බැවින් සමස්ථ වියදම වාරික වශයෙන් ඔහුගේ වැටුපෙන් අයකරනු ලබයි. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතුය. |
| ii.මුදල් රෙගුලාසි 395 (ඇ) | සෑම බැංකු ගිණුමක් සඳහාම එක් එක් මාසය අවසානයේදී පැවති තත්ත්වය පිළිබඳ ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශන පිළයෙල කල යුතු වුවත්, කොමිෂන් සභාවේ ප්‍රධාන ජංගම ගිණුමට අදාලව 2019 දෙසැම්බර් මාසයේ සිට 2020 පෙබරවාරි මාසය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන 2020 ජුනි 15 දින දක්වාම පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 395 (ඇ) අනුවම බැංකු සැසඳුම් වාර්තා විගණන අංශයට බාරදීමට කටයුතු සැලසුම් කර ඇත. | ශක්තිමත් අභ්‍යන්තර පාලනයක් ඇති කර නියමිත පරිදි බැංකු සැසඳුම් පිළියෙල කල යුතුය. |
| iii.මුදල් රෙගුලාසි 188 (2) | බැංකුවේ තැන්පත් කල නමුත් උපලබ්ධි වී නොමැති මාස 06 සිට මාස 24 ක් ගත වී ඇති එකතුව රු. 3,209,720 ක්වූ චෙක්පත් 309 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ ප්‍රමාදය නිසා මෙම තත්වය හටගත් අතර 2017, 2018 වර්ෂයට අදාළ උපලබ්ධි නොවූ මුදල් තැන්පත් පිළිබඳ පරික්ෂාකර ඒවාට අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි. | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර අවශ්‍යය ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| iv.මුදල් රෙගුලාසි 396 | නිකුත් කර ඇතත් වලංගු කාලය අවසන් වී ඇති එකතුව රු. 6,497,642 ක් වූ චෙක්පත් 517 ක් සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙළ කිරීමේ ප්‍රමාදය නිසා මෙම තත්වය හටගත් අතර වලංගු කාලය අවසන් වූ චෙක්පත් සම්බන්ධයෙන් අදාළ ගැලපීම් සිදු කිරීමට කටයුතු කරමි. | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර අවශ්‍යය ගැලපීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. යුතුය. |
| v.මුදල් රෙගුලාසි 371 (2) (ඈ) ඡේදය හා 2015 ජූලි 14 දිනැති අංක 3/ 2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | i. තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම මාණ්ඩලික නිලධාරියෙකු වෙත පමණක් සිදුකල යුතු වුවත් කොමිෂන් සභාව විසින් ඊට පටහැනි ලෙස අවස්ථා 110 කදී මාණ්ඩලික නිලධාරීන් නොවන නිලධාරීන් 28 දෙනෙකු වෙත එකතුව රු. 3,097,597 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. | පසුගිය වර්ෂයේ විගණන වාර්තාව හා එම උපදෙස් අනුව 2019.07.03 දින සිට මුදල් රෙගුලාසි 371 (2) හා 2015 ජූලි 14 රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව තරයේ කටයුතු කර ඇත. | යොමුගත රෙගුලාසි ප්‍රකාර කටයුතු කල යුතුය. |
| | ii. කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කල හැකි වුවත් ඊට පටහැනිව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අවස්ථා 45 කදී නිලධාරීන් 30 දෙනෙකු වෙත රු. 102,000 ක සිට රු. 3,894,302 ක් දක්වා පරාසය තුල තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | සමාලෝචිත වර්ෂයේදී විභාග කටයුතු සඳහා ලබාගත් සීමා ඉක්මවූ අත්තිකාරම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් වාචිකව උපදෙස් මත කටයුතු කල බව සඳහන් කරමි. | යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | iii. තත්කාර්ය අතුරු අග්‍රිම ලෙස ලබා ගන්නා මුදල් අදාල කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත්, අත්තිකාරම් ලබාගෙන වසරකට වැඩි කාලයක් ගතවී ඇතත් 2020 ජුනි 30 දින දක්වාම පියවා නොතිබුණු රු.2,760,082ක හර ශේෂ හා රු. 593,236 ක බැර අත්තිකාරම් ශේෂ පැවතුණි. | මෙම අග්‍රිම නිසි පරිදි කාර්යය නිමකළ වහාම පියවීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව නියමිත පරිදි අත්තිකාරම් පියවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 14,567,897 ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 29,585,644 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,017,747 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් වියදම් වැඩවීම හා ව්‍යාපෘති ආධාර අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමස්ථ ආදායම පිරිහීම සඳහා සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති ආධාර ඉකුත් වර්ෂයට සපේක්ෂව සියයට 25.8 කින් අඩුවීම බලපා තිබුණු අතර පෞද්ගලික පඩිනඩි සියයට 6.3 කින්, ගමන් වියදම් සියයට 60 කින් හා මෙහෙයුම් වියදම් සියයට 19.6 කින් වැඩිවීම සමස්ථ වියදම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2018 වර්ෂයේදී 5.74 ව පැවති ජංගම වත්කම් අනුපාතය 2019 වර්ෂය වන විට 8 දක්වා වර්ධනය වී තිබුණි. එනම් පෙර වර්ෂයට සාපේක්ෂ ජංගම වගකීම් පියවීම සඳහා පවතින ජංගම වත්කම් ප්‍රමාණය 2.26 කින් වර්ධනය වී තිබුණි.

තවද ක්ෂණික වත්කම් අනුපාතය සැලකීමේදී 2018 වර්ෂයේදී 5.48 ව පැවති මෙම අනුපාතය 2019 වර්ෂය වන විට 7.7 දක්වා වර්ධනය වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොමිෂන් සභාවේ අවසන් ඇගයීම් ක්‍රියාවලි (Procedure) අනුව තක්සේරු කරුවන් විසින් අවසන් ඇගයීම් පවත්වන දින සිට සති 2 ක් ඇතුළත ඇගයීම් ප්‍රතිඵල තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඇගයීම් පවත්වා මාස 03 කට වැඩි කාලයකට පසුව එම ප්‍රතිඵල කොමිෂන් සභාවට ඉදිරිපත් කර තිබූ බවට ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පරීක්ෂණ හා ඇගයීම් අංශයෙන් ලබාගත් තොරතුරු අනුව නිරීක්ෂණය විය. | පිළිතුරු සපයා නැත. | ඇගයීම් ක්‍රියාවලිය හා ප්‍රතිඵල ලබාදීම, සහතික පත්‍ර ලබාදීම කඩිනමින් සිදු කිරීම තුලින් කාර්යක්ෂම සේවාවක් ලබාදීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 1990 අංක 20 දරන පනතේ 2 වගන්තිය අනුවකොමිෂන් සභාව විසින් පුහුණු සැලසුම් (VET Plan) සකස් කර අදාල වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් සිදුකර ක්‍රියාත්මක කල යුතු නිර්දේශ අදාල වෘත්තිය පුහුණු ආයතන වෙත ලබාදී නොතිබුණි. | පිලිතුරු සපයා නැත. | සැලසුම් සකස් කර අදාල වෘත්තිය පුහුණු ආයතන වෙත ලබාදී ඒවා ක්‍රියාත්මක කරවීම කෙරෙහි අවධානය යොමු කල යුතුය. |
| (ආ) ජාතික නිපුණතා සම්මත සකස් කිරීම සඳහා තෘතියික වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ පිහිටුවන ලද සංචාරක කාර්මාන්ත ආංශික නිපුණතා සභාව සඳහා 2018 වර්ෂය තුල ආංශීක නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. 2,034,886 ක් වියදම් කර තිබුණද අරක්කැමි හා බේකරි පාඨමාලාවන් සඳහා ජාතික නිපුණතා සම්මතයන් යාවත්කාලීන කර නොතිබුණි. | පිලිතුරු සපයා නැත. | සියළුම පාඨමාලා සඳහා නිපුණතා සම්මත හා විෂය නිර්දේශ යාවත්කාලීන කර වර්තමානයට ගැලපෙන පරිදි වෘත්තිකයන් බිහිකිරීම කෙරෙහි අවධානය යොමුකල යුතුය. |
| (ඇ) 2018 වර්ෂයට අදාල පුහුණු මධ්‍යස්ථාන 13 ක පවත්වා ගෙන ගිය සංචාරක හෝටල් ක්ෂේත්‍රයට අදාල පුහුණු පාඨමාලා 28 ක ආධුනිකයන්ගේ ඇගයීම් සිදු කර නොතිබුණු බව විගණන දිනය වූ 2019 දෙසැම්බර් 03 දින සිදුකල පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | පිලිතුරු සපයා නැත. | නියමිත කාල පරිච්ඡේදය තුල ඇගයීම් කටයුතු සිදු කිරීමට කටයුතු කල යුතුය. |